ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
ගිණුම්කරණය සහ මූල්‍ය - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
මානව සම්පත් කළමනාකරණය - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
අලෙවිකරණ කළමනාකරණය - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය

HRU4506- මානව සම්පත් කළමනාකරණය
අවසාන විභාගය – 2024 / 2025
කාලය – පැය තුනයි **(03)**

---

*දිනය: **2026.01.04*** *වේලාව: ප.ව. **01.30** – ප.ව. **04.30***

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ. ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ලබා දී ඇති පොත භාවිතා කරන්න.
- අපැහැදිලි අත් අකුරු ලකුණු අඩු වීමට හේතු වේ.

ප්‍රශ්නය 01

a) "මානව සම්පත් කළමනාකරණය" යන්න නිර්වචනය කර වර්තමාන ගතික ව්‍යාපාරික පරිසරය තුළ එහි වැදගත්කම සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

b) "සේවක භූමිකාවන් ආයතනික ඉලක්ක සමඟ පෙළගැස්වීමේදී රැකියා නිර්මාණය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි." රැකියා විස්තරය සහ රැකියා පිරිවිතරය පිළිබඳ සංකල්ප පැහැදිලි කර රැකියා නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී ඒවායේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

ප්‍රශ්නය 02

a) "සේවක ආකර්ශනය සහ සේවක තෝරා ගැනීම යනු ඕනෑම සංවිධානයක මානව සම්පත් කළමනාකරණයේ වැදගත්ම කාර්යයන් දෙකකි."

(i) " සේවක ආකර්ශනය" (Recruitment) සහ "සේවක තෝරා ගැනීම" (selection) යන සංකල්ප නිර්වචනය කරන්න.

(ලකුණු 04)

(ii) සේවක ආකර්ශනය කර ගැනීමේ ක්‍රම තුනක් (03) සහ සේවක තෝරා ගැනීමේ ක්‍රම තුනක් (03) සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

b) "පුහුණුව යනු සේවකයින්ට ඵලදායී ලෙස සේවය කිරීමට අවශ්‍ය කුසලතා ලබා දීම සඳහා සිදුකරනු ලබන ක්‍රමානුකූල ක්‍රියාවලියකි. සේවකයින් පුහුණු කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

ප්‍රශ්නය 03

ආයතනික සාර්ථකත්වයේ තීරණාත්මක සාධකයක් ලෙස "සේවක සහභාගීත්වය (employee engagement) වැදගත් බව පිළිගනු ලබයි. කෙසේ වෙතත්, බොහෝ සංවිධාන තවමත් ඉහළ මට්ටමේ සේවක සහභාගීත්වයක් පවත්වා ගැනීම සඳහා අරගල කරයි."

a) "සේවක සහභාගීත්වය (employee engagement) යන්න පැහැදිලි කර ඉන් සේවකයින්ට සහ ආයතනයට සිදුවන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 10)

b) නූතන සේවා ස්ථානවල සේවක සහභාගීත්වය වැඩිදියුණු කිරීමේ දී කාලීන වශයෙන් මුහුණ දෙනු ලබන අභියෝග සහ උපාය මාර්ග පිළිබඳව ඇගයීමක් සිදුකරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

ප්‍රශ්නය **04**

a) "මානව සම්පත් කළමනාකරණය සංවිධානයේ අභ්‍යන්තර පරිසරය සහ බාහිර ව්‍යාපාරික තත්වයන් යන දෙකෙන්ම බලපෑම් ලබයි." සමකාලීන සංවිධානවල මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් කෙරෙහි අභ්‍යන්තර හා බාහිර සාධක බලපාන ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 10)

b) "වර්තමානයේදී සේවා ස්ථාන නිරන්තරයෙන් පරිණාමයට ලක්වෙමින් පවතින අතර, එය මානව සම්පත් කළමනාකරණය සඳහා නව අභියෝගතා ඉදිරිපත් කරයි."

ව්‍යාපාර සංවිධානවල මානව සම්පත කළමනාකරණය කිරීමේ දී මුහුණ දෙන කාලීන ගැටළු සාකච්ඡා කර මානව සම්පත් වෘත්තිකයන් මෙම අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දිය යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

Question 05

a) "මානව සම්පත් සැලසුම්කරණය මඟින් සංවිධානයකට නිවැරදි පුද්ගලයින්, නිවැරදි කාලයේ දී නිවැරදි තනතුරට, බඳවාගෙන ස්ථාපිත කිරීම සහතික කරනු ලබයි." මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10)

b) "මානව සම්පත් කළමනාකරණය පිළිබඳ න්‍යායන් සංවිධාන තම ශ්‍රම බලකාය ඵලදායී ලෙස කළමනාකරණය කරන ආකාරය සහ අභිප්‍රේරණය වන ආකාරය පැහැදිලි කරනු ලබයි". මානව ප්‍රාග්ධන න්‍යාය සහ නියෝජිතායතන න්‍යාය පැහැදිලි කර සමකාලීන සංවිධානවල මානව සම්පත් කළමනාකරණ භාවිතයන්ට ඒවායේ ඇති අදාළත්වය විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

Question 06

a) "සේවක නියෝජනය (Employee representation) සහ සාකච්ඡා (negotiations) සංවිධානවල කාර්මික සබඳතාවල වැදගත් අංග වේ." "වෘත්තීය සමිති" සහ "සාමූහික කේවල් කිරීම" යන සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 10)

b) "සංවිධාන තුළ ගැටුම් නිරාකරණය කර ගැනීමට සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ගිවිසුම් ඇති කර ගැනීමට ඵලදායී සාකච්ඡා අත්‍යවශ්‍ය වේ." ඵලදායී සාකච්ඡා ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු: 20)

-All rights reserved-